රසික සූරියආරච්චි

කුඩා දරුවන් මල් මෙන් යැයි අපි නිතර කියමු. ඔවුන් ගේ දසුන සුන්දරය. වර්ණවත්ය. අහිංසකත්වයේ, අවංකත්වයේ සහ අව්‍යාජත්වයේ ගුණ සුවඳ ඔවුන්ගෙන් විසිරේ. ඔවුන් ගේ බස් අප සවනට පිය තෙපුල් ය. ඔවුන් ගේ චර්යාව, හැසිරීම, ගති පැවතුම සුසිනිදු මල් පෙත්තක මටසිලිටු බව සිහි ගන්වයි.

# ඉස්කෝලෙ කාලේ

## සුන්දර ළමා වියට අප යළි ගෙනයන ජගත් ජේ. එදිරිසිංහ සැදූ මැජික් දෙරටුව

නමුත් මේ මල් වැනි කුඩා දරුවන් හැදෙන්නේ, වැඩෙන්නේ ඕජස් ගලන ගුජුප්සාජනක කුණු කන්දලින් පිරී ගිය මේ අසීලාචාර සමාජයේ බව අපට අමතක කළ නොහැක.

පොහොට්ටුවෙන් සුපිපි කැකුලට පෙරලෙන මේ සුන්දර, පියකරු, මටසිලිටු, සුවඳ විහිදුවන මල් සමූහය චණ්ඩ හිරු රැස් මැද පීඩා විඳිති. සැඩ සුලඟට හසුව සැලෙති. බඹර පහරට අසුව කිලිටි වෙති. නැඩ වර්ෂාවෙන් පීඩා විඳිති. අවසානයේ ඒ සුපිපි පුෂ්පයෝ මුකුලිතව මිලානව ගොස් තමන් සිටින පෙරකී පරිසරයටම එකතු වෙති.

මේ ලෝක ස්වභාවය මිනිස් සමාජයද පොදුය. තමා වෙසෙන සමාජය විසින් මිනිසා හදනු ලබන බව කියවෙන්නේ නිකමට නොවේ. සමාජයේ ගොදුරක් වීමෙන් ගැලවී සඳහටම වර්ණවත්ව බබලමින් ගුණ සුවඳ විහිදන්නෝ ඉතා අල්පය.

මේ හැඳින්වීමත් සමගම මා සැරසෙන්නේ, සුන්දර ළමා විය පිළිබඳව අප බොහෝ දෙනෙකුගේ චිත්ත සන්තානයන් හි යට ස්ථරවල ස්ථිරව තැන්පත් වී ඇති මිහිරි මතක නිධානයන් කිරිමුහුද කලඹවා කල්ප වෘක්ෂය මතුකරගත්තාක් සේ පාදගන්නට ඉවහල්වෙන, තත්වයෙන් මහා මේරු පර්වතයක් සේ සැලකිය හැකි නමුදු ප්‍රමාණයෙන් කුඩා නවකතා පොතක් පිළිබඳව ඔබට පවසන්නටයි.

කුඩා පාසලක, කුඩා පන්තියක ඉගෙනුම ලබන කුඩා කොළු ගැටයෙකුගේ ජීවිත කතාවේ රසබර, දුක්බර, ප්‍රීති ජනක, ශෝක ජනක කතාන්දරය අපට කියන මේ කුඩා නවකතාව, ඕස්ට්‍රේලියානු වාසී සිංහල නවකතාකරුවෙකු වන ජගත් ජේ එදිරිසිංහ ලියූ ඉස්කෝලෙ කාලේ නම් වේ.

නවකතා කිහිපයක්, කාව්‍ය සංග්‍රහ දෙකක් සහ තවත් ගද්‍ය, පද්‍ය නිර්මාණ රාශියක් සිංහල සාහිත්‍යයට එක් කර ඇති ජගත් ජේ. එදිරිසිංහ ලේඛකයා අප වඩාත් හොඳින් අඳුනන්නේ පහන සහ සන්නස මාසික සඟරාමය පුවත්පත් වල ආරම්භක සංස්කාරකවරයෙකු වශයෙනි. දයාවංශ ජයකොඩි සමාගම විසින් ප්‍රකාශිත ජගත්ගේ අසුර අඩවිය, ගිම්හාන සුලඟ සහ තාරුකා විජිතය යන නවකතා ත්‍රිත්වයම අප මුලින් කියවූයේ පෙරකී පහන සහ සන්නස සඟරාවල කොටස් වශයෙන් පලවෙද්දී වුවද, ගොඩගේ ප්‍රකාශනයක් ලෙස 2010 ජනවාරියේ දී දෙරට වැඩි ජගත් ගේ නවතම කෘතිය වන ඉස්කෝලෙ කාලේ නවකතාව අප අතරට එන්නේ එක එල්ලේ කියවා රස විඳීමේ අවස්ථාව අපට ලබා දෙමින් වීම විශේෂයකි.

ඕස්ට්‍රේලියාවේ අප අතර වෙසෙමින්, විගාමික සිංහල සාහිත්‍යයට කෙරෙන ඕස්ට්‍රේලියානු සම්මාදම දිනෙන් දිනම ඉහල නංවන ජගත් ගේ ඉස්කෝලෙ කාලේ නවකතාව මා මෙහිදී විමර්ශනය කරන්නට අදහස් කරන්නේ එලෙස මූලික වශයෙන් විගාමික සාහිත්‍ය කෘතියක් ලෙස සලකා නොව, සිංහල ප්‍රභන්ධ සාහිත්‍යයේ එක් උප ප්‍රධාන අංශයක් වන යොවුන් නවකතාවක් ලෙස සලකාය.

මාර්ටින් වික්‍රමසිංහ ගේ "මඩොල්දූව", ටී.බී. ඉලංගරත්න ගේ "අඹ යහළුවෝ", දෙන් පීටර් පියතුමා ගේ "වනගත දරුවෝ" සහ කුලසේන ෆොන්සේකා ගේ "රන්සිරි ගේ සංග්‍රාමය" වැනි නවකතාවලින් මග සලකුණු තැබූ සිංහල යොවුන් සාහිත්‍යය යනු සිංහල නවකතාවේ උපත සහ පෝෂණය සිදුවූ පසුගිය සියවසක පමණ කාලය තුල එතරම් දියුණුවට පත් නොවූ අංශයකි. අප දන්නා බටහිර ඉංග්‍රීසි යොවුන් සාහිත්‍යය හා සසඳා බලන කල මෙය ඉතා හොඳින් කැපී පෙනේ. මෙයට හේතුව විශ්ලේෂණය කිරීම වෙනනම මාතෘකාවක් නිසා ඉතා සරලව පැවසිය හැක්කේ ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණයත්, සිංහල යොවුන් සාහිත්‍යයේ මන්දපෝෂණයත් එකම කාසියේම දෙපැත්ත බවයි. ශාරීරික මන්දපෝෂණයට අඩු තරමේ ත්‍රිපෝෂවත් ලැබේ.

මෙවන් පසුබිමක් යටතේ ජගත් ජේ. එදිරිසිංහ, ඉස්කෝලෙ කාලේ රචනා කිරීමෙන් පොදුවේ සිංහල සාහිත්‍යයටත්, සුවිශේෂීව බටහිර යොවුන් සාහිත්‍ය කෘතිවල සරල පරිවර්තන කියවීම වෙනුවට වෙනත් විකල්ප හිඟයෙන් පෙලෙන යොවුන් නවකතා පාඨකයින් ට කර ඇත්තේ කාලීන මෙන්ම අගනා සේවාවක් බව නොබියව කිව හැක. මා එලෙස යොවුන් නවකතාවක් ලෙස ඉස්කෝලෙ කාලේ කෘතිය හඳුන්වා දුන්නද, මේ නවකතාවේ රසය උපරිම වශයෙන් විඳින්නට ලැබෙන්නේ තම ළමා කාලය කලකට ඉහත ශ්‍රී ලංකාවේ ගත කල අප වැනි අද මැදිවිය ගෙවන්නන්ට යැයි මම සිතමි.

ඒ එසේ වන්නේ, ඉස්කෝලෙ කාලේ නවකතාවේ පිටු අතරින්, පරිච්ඡේද අතරින්, ඡේද අතරින්, වාක්‍ය අතරින්, අකුරු අතරින් අපට දැන් දැන් මතකාබාධ වැලි තලාවෙන් වැසියන අපේ සුන්දර ළමා කාලයට යලි පිවිසෙන්නට, යලිත් සුදු අත් කොට කමිසයකින් සහ කොට කලිසමකින් හෝ සුදු රැලි ගවුමකින් සැරසී පාසල් යන්නට අපට මානසිකව ඉඩ ලැබෙන බැවිනි.

ඉස්කෝලෙ කාලේ නවකතාව ගෙතී ඇත්තේ ප්‍රාථමික පාසලක ඉගෙනුම ලබන කුඩා දරුවෙකු වන සමන් ගේ එදිනෙද ජීවිතයේ අත්දැකීම් ඇසුරිනි. මෙහිදී සමන් ගේ පාසලේ කතා මෙන්ම, ඔහුගේ




පවුලේ කතා ද, ඔහු වසන ගම්මානය පසුබිම් කරගත් කතා ද, එකිනෙක සම සමව මුසුකරමින්, වරෙක හාස්‍යය ද, වරෙක අනුකම්පාව ද, වරෙක සංවේගය ද, වරෙක කෝපය ද, වරෙක සතුට ද පාඨක සිත් සතන් තුල ජනිත කරමින් නිදහසේ ගලායන නවකතාවක් රචනා කිරීමට ජගත් ජේ. එදිරිසිංහ සමත්වී ඇත.
සම වයසේ යහළු යෙහෙළියන් සමග සමන් සිසුවා පාසලේ ඉගෙන ගන්නා හැටි, කොල්ලන් සමග ගම පුරා කරක් ගහනා හැටි මෙන්ම සමාජ අසාධාරණයන් සහ නපුරු ගුරුවරුන් නිසා තබ්ලාව වැයීම ඉගෙන ගන්නට, විවිධ ප්‍රසංගයන්හි නාට්‍ය, ගායනා යනාදිය ඉදිරිපත්කිරීමට, දිස්ත්‍රික් ගායනා තරග සඳහා සහභාගීවන්නට සමන්ට ඉඩ ඇහිරෙන අයුරු ජගත් ජේ. එදිරිසිංහ සරල සිංහල බසින් විස්තර කරන්නේ පාඨක සිත නවකතාවේ අවසානය දක්වාම බැඳ තබා ගනිමිනි.

සමස්ත කතා වස්තුව සලකා බලන කල, මා මේ ලිපිය ආරම්භයේ භාවිතා කළ මල් සහ පරිසරය පිළිබඳ උපමාව මෙහිදී තරමක් නොගැලපෙතැයි මට සිතේ. එසේ වන්නේ, ළමුන්ට අසාධාරණකම් කරන ගුරුවරුන් අතර තම යුතුකම් සහ වගකීම් නිසි අයුරින් ඉටු කරන හොඳ ගුරුවරුන්ද, තබ්ලා ඉගෙනුම අහිමි වූ පුතුට ඩෝලැක්කියක් හෝ ගෙනැවිත් දෙන දෙමව්පියන් ද ඉස්කෝලෙ කාලේ නවකතාවේ සිටින බැවිනි.

එය එසේ වුවද, ජගත් ජේ. එදිරිදිසිංහ මේ නවකතාව අවසානයේ නපුරු සමන්මලී ගුරුතුමිය ක්ෂණිකවම හොඳ චරිතයකට පරිවර්තනය කරමින් ද, සමන් ට කවි ගායනා තරගයේ ජය ලබා දෙමින් ද කර ඇත්තේ පැවති සහ පවතින සමාජීය යතාර්ථයෙන් ඉවත්ව යෑමක් බව නම් මම ඉඳුරාම පවසමි.

"අවසානයේ යුක්තිය, සත්‍යය සැමවිටම ජය ගනී" යන ලොව පිළිගත් මිත්‍යා විශ්වාසය තවදුරටත් ඉදිරියට ගෙනයාමට මෙමගින් නවකතාකරුවා අනියම්ව සහය දෙන බව මගේ විචාරක ඇසට පෙනේ. කෙසේ නමුත් එලෙස සුඛාන්තයක් සහිතව නවකතාව අවසාන කිරීම මගේ පාඨක සිතට නම් මහත් වූ අස්වැසිල්ලක් ම විය.

හැත්තෑව දශකය පමණ නුදුරු අතීතයක් මත පදනම් වූ ඉස්කෝලෙ කාලේ නවකතාවේ කතානායක සමන් දිවි ගෙවන්නේ මිරිහාන, මාදිවෙල, ඇඹුල්දෙනිය වැනි මුළුමනින්ම නොවූවද බොහෝ දුරට සම්ප්‍රදායානුකූල ග්‍රාමීය පරිසරයකයි. අද හතලිස් වසරක් ලබන විට ඒ ප්‍රදේශ කෙතරම් නාගරීකරණය වී ඇතිද, දූෂණය වී ඇතිද යන්න අමුතුවෙන් කිව යුතු
නොවේ.

කෝට්ටේ කළාලේ කිසිල්ලේ ද?

ප්‍රධාන කතා පුවතෙන් බාහිරව නවකතාවේ වාක්‍ය පේලි අතර සැකෙවින් ලියවී ඇති ඒ ගම්පෙරලියේ කතාව ද මා මෙහිදී පාඨකයින් ගේ විශේෂ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් කිව යුත්තේ, ජගත් ජේ. එදිරිසිංහ රචනා කරන ලද ඉස්කෝලෙ කාලේ නවකතාව සුන්දර ළමා වියට අප යලි කැටුව යන මැජික් දෙරටුවක් ම බවයි. ඒ දෙරටුවෙන් ඔබ්බට ගොස් රිසි පරිදි අතීතකාමයේ ගැලෙන්නට මම ඔබට ආරාධනා කරමි.

rasika.suriyaarachchi@gmail.com

## DEVI BALIKA VIDYALAYA Family BBQ




What a fantastic success!! On Saturday the 03rd Dec 2011, over 70 old girls and 7 teachers of Devi Balika Vidyalaya, Colombo attended the "Devians in Melbourne" get- together at Jells Park, Wheelers Hill. The Numbers far exceeded the organisers' initial expectations which indicated the strong desire for such events for all past pupils and teachers. Many thanks go out to all the enthusiastic attendees and the great organisers of the event, Sreeni, Sonali, Indira, Amani, Rohini, Rangana, Janani, Thanuji, Nayana, Rasika, Menik, Dayani, and Chintha led by Neranjana Kudaligama. It was commonly agreed that the older we get, the more we value our friendships.

On 11th February 2012 Devians will mark a historic day. It will be a time of pride for all Devians who exhibited their affection for the school at the get- together to establish a branch of "Devi Past Pupils Association", in Melbourne, Australia. This is an invitation for all Devians in Melbourne to attend the inaugural meeting at Mount Street Neighborhood House, 6 Mount Street, Glen Waverley Vic 3150, on 11th Feb 2012 at 4 pm. Contact Neranjana Kudaligama on 0408356821 or Chintha Kossinna on 0421852769 for more information.